ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා)උපාධි වැඩසටහන-පස්වන මට්ටම 2017/2018

අවසාන පරීක්ෂණය - 2018

අධ්‍යාපන මනෝ විද්‍යාව - ESU3225

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2018.01.29 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

**<u>1 වන කොටස</u>**

01. පන්තිකාමර විනය පවත්වාගෙන යාම සඳහා අධ්‍යාපන මනෝවිද්‍යාවෙන් ගුරුවරයාට ලැබෙන සහාය කරුණු තුනක් (03) මඟින් පැහැදිලි කරන්න.

02. ළමුන් තුළ 'සූදානම' තීරණය කෙරෙන සාධක දෙක (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

03. පූර්ව ක්‍රියාකාරී චින්තන අවධියේ ළමුන්ගේ චින්තනයේ ලක්ෂණ දෙකක් දක්වා ඔවුන් සමඟ කටයුතු කිරීමේ දී ගුරුවරුන් විසින් අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග දෙකක් (02) පැහැදිලි කරන්න.

04. ෆ්‍රොයිඩ් විසින් දක්වන ලද පුද්ගල පෞරුෂයේ අංශ තුන (03) පැහැදිලි කරන්න.

05. ඉගෙනුම් මාරුව සුසාධ්‍යකරණය කිරීම සඳහා යොදාගත හැකි උපාය මාර්ග දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

06. විගොට්ස්කි විසින් හඳුන්වා දෙන ලද පුද්ගලයකු තුළ පවතින අවිදූර සංවර්ධන කලාපය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

07. ළමා චර්යා අධ්‍යයන ක්‍රමයක් ලෙස 'සහභාගිත්ව නිරීක්ෂණ'යෙහි ඇති වැදගත්කම නිදසුනක් (01) ඇසුරෙන් පැහැදිලි කරන්න.

08. ගුරුවරයෙකුගේ ක්‍රියාකලාපය පාසැල් සිසුන් තුළ අහිතකර චිත්තවේග ඇති කිරීමට හේතුවන අවස්ථා තුනක් (03) විස්තර කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) ඉගෙනීම පිළිබඳව න්‍යායාත්මක පදනම අධ්‍යයනය කිරීමෙන් ගුරුවරයෙකුට ලබාගත හැකි විවිධ ප්‍රයෝජන තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) ක්ෂේත්‍ර ප්‍රජානන න්‍යායේ ප්‍රධාන මූලධර්ම උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) නාට්‍ය හා රංගකලා විෂයේ ඕනෑම ශ්‍රේණියකට අදාළ ඕනෑම පාඩමක් තෝරාගෙන එම පාඩම ඉගැන්වීමේ දී ක්ෂේත්‍ර ප්‍රජානන න්‍යායයේ මූලධර්ම යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න. මෙම ඉගැන්වීමේ දී ගුරුවරයාගේ කාර්යභාරය නිදසුන් දෙකක් ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

10. (i) ප්‍රජානන ක්‍රියාවලිය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) නව අත්දැකීම් ලබා ගැනීමත් සමඟම ළමුන් තුළ අළුත් ස්කීමා ගොඩ නැඟෙන ආකාරය උදාහරණයක් ඇසුරින් පියාජේගේ ප්‍රජානන සංවර්ධන න්‍යායට අනුව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(iii) සිසුන්ගේ මතකයේ රැඳීම වැඩි දියුණු කිරීම සඳහා ගුරුවරයෙකුට යොදාගත හැකි ක්‍රියාමාර්ග තුනක් **(03)** උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

11. (i) (අ) වැඩීම හා සංවර්ධනය අතර වෙනස නිදසුන් දෙකක් **(02)** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ආ) ආරය සහ පරිසරය ළමයෙකුගේ වැඩීම සහ සංවර්ධනය කෙරෙහි බලපාන ආකාරය නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) පූර්ණ සංවර්ධනය යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

(iii) නාට්‍ය හා රංගකලා විෂය උගන්වන ගුරුවරයෙකුට ළමුන් තුළ "පූර්ණ සංවර්ධනයක්" ඇති කරලීම සඳහා දැක්විය හැකි දායකත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 08)

12. (i) සුදුසු නිර්වචන ඇසුරෙන් පුද්ගලයෙකුගේ පෞරුෂය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) දරුවන්ගේ පෞරුෂ සංවර්ධනයට බලපාන සාධක අදාළ නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii) ප්‍රාථමික පාසල් මට්ටමේ ඉගෙනුම ලබන සිසුන්ගේ පෞරුෂ සංවර්ධනය සුසාධ්‍යකරණය කිරීම සඳහා ගුරුවරයෙකුට ගත හැකි ක්‍රියාමාර්ග **හතරක් (04)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. (i) පුද්ගලයෙකුගේ ජීවිතයේ 'නවයෞවන අවධිය' යනු කුමක්දැයි නිර්වචනය කරන්න. (ලකුණු 03)

(ii) ජීවිතයේ අන් අවධිවලට වඩා නව යෞවන අවධිය සුවිශේෂී අවධියක් ලෙස සැලකීමට හේතුව නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) නවයෞවන අවධියේ සිටින සිසුන්ගේ ඉහළ ප්‍රජානන හැකියා සංවර්ධනය කිරීමේ ලා නාට්‍ය හා රංගකලා විෂය උගන්වන ගුරුවරයෙකුට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක් (03)** නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 12)

14. (i) පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සිසුන්ගේ පෙළඹීම ඇති කිරීම වැදගත් වන්නේ ඇයිදැයි කරුණු **තුනක් (03)** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) පෙළඹීම පිළිබඳ ප්‍රජානන ප්‍රවේශය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළ කර ගැනීමේ දී ගුරුවරයාගේ කාර්යභාරය විය යුත්තේ කුමක්දැයි නිදසුන් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) එම ප්‍රජානන ප්‍රවේශය සිසුන්ව ඉගෙනුමට පෙළඹවීම සඳහා යොදා ගැනීමේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 06)

හිමිකම් ඇවිරිණි.